## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ සහකාර කථිකාචාර්ය (MN - 7) තනතුරට සීමිත පදනමින් බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම - 2024

අංක PSC/EST/07-01-41/01/2017 හා 2018.01.09 දිනැති ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ කළමනාකරණ සහකාර අධිපන්තිය සේවා ගණයේ සහකාර කථිකාචාර්ය තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ විධි විධාන ප්‍රකාරව, එකී තනතුරට පවතින පුරප්පාඩු හතරක් (4) සීමිත බඳවා ගැනීම යටතේ සම්පූර්ණ කිරීම සඳහා අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට සක්‍රීය සේවයේ නියුතු පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. සුදුසුකම්

   1.1. පළපුරුද්ද

   1.1.1. ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ ක්‍රීඩා උපදේශක තනතුරක වසර පහක (5) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා III වන පන්තියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් සමත්ව තිබීම.

   1.2. කායික සුදුසුකම්
   සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තම තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

   1.3. වෙනත් සුදුසුකම්

   1.3.1. ක්‍රීඩා උපදේශක තනතුරේ ස්ථිර කර තිබීම
   1.3.2. පූර්වාසන්න වසර පහක (5) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම
   1.3.3. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත වීම
   1.3.4. තනතුර සඳහා අවශ්‍ය ඉහත අනු අංක 1.1 සිට 1.3 දක්වා සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් නව දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

2. වැටුප් කේත අංකය හා වැටුප් පරිමාණය

   2.1 වැටුප් කේත අංකය : MN 7 - 2016

   2.2 මාසික වැටුප් පරිමාණය : රු. 41,580 - 11 X 755 - 18 X 1,030 - 68,425/=

3. බඳවා ගැනීමේ ක්‍රමය
   රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව එම කොමිෂන් සභාව විසින් සුදුසුකම සහිත අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ.

4. ලකුණු ලබා දීමේ පටිපාටිය

| අනු අංකය | විස්තරය | උපරිම ලකුණු ප්‍රමාණය | මුළු ලකුණු |
|---|---|---|---|
| 1. | අතිරේක අධ්‍යාපන සුදුසුකම්<br>I. විද්‍යාපති/ ශාස්ත්‍රපති උපාධිය - ලකුණු 20<br>(පර්යේෂණ නිබන්ධන සහිත)<br>II. පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - ලකුණු 10<br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.) | 20 | 20 |
| 2. | අධ්‍යාපන සුදුසුකම්<br>I. ක්‍රීඩාව හෝ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ උපාධිය - ලකුණු 20<br>II. ක්‍රීඩාව හෝ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලා - ලකුණු 16<br>(වසරක් හෝ ඊට වැඩි)<br>III. ක්‍රීඩාව හෝ ශාරීරික අධ්‍යාපනය සම්බන්ධ උසස් ඩිප්ලෝමා පාඨමාලා - ලකුණු 12<br>(මාස 06ක් හෝ ඊට වැඩි)<br>IV. ක්‍රීඩා සම්බන්ධ ඩිප්ලෝමා පාඨමාලාව - ලකුණු 08<br>(මාස 06ක් හෝ ඊට වැඩි)<br>V. ක්‍රීඩාවට සම්බන්ධ සහතිකපත් පාඨමාලා හෝ ඒ ඒ ක්‍රීඩාවට අදාළ ජාත්‍යාන්තර සංගමය මඟින් නිකුත් කර ඇති ඉහලම පුහුණු බලපත්‍රයක් තිබීම - ලකුණු 04<br>(එක් පාඨමාලාවකට හෝ පුහුණු බලපත්‍රයක් වෙනුවෙන් ලකුණු 01 බැගින්)<br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.) | 20 | 20 |
| 3. | අතිරේක පළපුරුද්ද<br>I. පාඨමාලා සම්බන්ධීකාරකවරයෙක් ලෙස කටයුතු කිරීම - ලකුණු 04<br>(වසරකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 04)<br>II. පර්යේෂණ හා ප්‍රකාශන ඉදිරිපත් කර තිබීම<br>(කණ්ඩායම් පර්යේෂණ / ප්‍රකාශන සඳහා ලකුණු ලබා දීමේදී උපරිම ලකුණු ප්‍රමාණය ඊට සහභාගි වූ සාමාජිකයින්ගේ ගණනින් බෙදා ගණනය කරනු ලැබේ) - ලකුණු 06<br>III. ජාතික මට්ටමේ ක්‍රීඩා විනිසුරුවෙක් ලෙස කටයුතු කිරීම හා ක්‍රීඩා පුහුණුකරුවෙක් ලෙස ජාතික මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් බිහි කර තිබීම - ලකුණු 05<br>IV. ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ අනුමැතිය මත බාහිර ආයතනවල ආරාධිත දේශන සිදු කර තිබීම - ලකුණු 07<br>V. ආයතනයේ සංවර්ධනය හෝ ඵලදායිතාව වැඩි කිරීම සඳහා දියත් කර ඇති ව්‍යාපෘති - ලකුණු 04<br>VI. ක්‍රීඩාවට අදාළ වෙනත් බාහිර ක්‍රියාකාරකම් සිදු කර තිබීම - ලකුණු 04 | | 30 |

| | | | |
|---|---|---|---|
| 04. | භාෂා හැකියාව<br>I. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - ලකුණු 15<br>(වසරක් හෝ ඊට වැඩි)<br>II. අ.පො.ස. සාමාන්‍ය පෙළ හෝ ඊට සමාන පරීක්ෂණයකදී - ලකුණු 10<br>ඉංග්‍රීසි භාෂාවට විශිෂ්ඨ සාමාර්ථ ලබා තිබීම<br>III. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතිකපත් පාඨමාලාවක් - ලකුණු 05<br>හදාරා තිබීම<br>(අවම මාස 03ක)<br>හෝ<br>I. මව් භාෂාව නොවන වෙනත් භාෂාවක් පිළිබඳ ඩිප්ලෝමා - ලකුණු 15<br>පාඨමාලාවක් ලබා තිබීම(මාස 06ක් හෝ ඊට වැඩි)<br>II. අ.පො.ස. සාමාන්‍ය පෙළ හෝ ඊට සමාන පරීක්ෂණයකදී - ලකුණු 10<br>මව් භාෂාව නොවන වෙනත් භාෂාවකට විශිෂ්ඨ සාමාර්ථ ලබා තිබීම<br>III. මව් භාෂාව නොවන වෙනත් භාෂාවක් පිළිබඳ සහතිකපත් - ලකුණු 05<br>පාඨමාලාවක් හදාරා තිබීම<br>(උපරිම සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.) | 15 | 15 |
| 5. | පරිගණක දැනුම<br>I. තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධි පාඨමාලාව - ලකුණු 10<br>(වසර 03ක් හෝ ඊට වැඩි)<br>II. තොරතුරු තාක්ෂණය විෂයක් ලෙස හදාරා ඇති - ලකුණු 07<br>උපාධි පාඨමාලාවක්<br>III. තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - ලකුණු 05<br>(මාස 06ක් හෝ ඊට වැඩි)<br>IV. තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත් පාඨමාලාව - ලකුණු 03<br>(උපරිම සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.) | 10 | 10 |
| 6. | සම්මුඛ පරීක්ෂණයේ දක්වන කුසලතා<br>මෙහිදි නම් කරනු ලබන මාතෘකාවක් පිළිබඳ විනාඩි 5-10 අතර ඉදිරිපත් කිරීමක් සඳහා ලකුණු ලබා දේ<br>i. අරමුණ හා දැක්ම - ලකුණු 01<br>ii. අදාළත්වය - ලකුණු 01<br>iii. නිර්මාණශීලීත්වය - ලකුණු 01<br>iv. කාල කළමනාකරණය - ලකුණු 01<br>v. ඉදිරිපත් කිරීමේ හැකියාව - ලකුණු 01 | | 5 |
| | මුළු ලකුණු | | 100 |

සැ.යු. -

I. ක්‍රීඩා උපදේශක සේවයේ තනතුරට බඳවා ගැනීමේදී, උසස් කිරීමකදී, කාර්යක්ෂමතා කඩඉම් සඳහා හෝ දෙපාර්තමේන්තු පරීක්ෂ සඳහා ඉදිරිපත් කරන ලද සහතික සඳහා නැවත ලකුණු ලබා දෙනු නොලැබේ.

II. ඉහත උපාධි හා ඩිප්ලෝමා සුදුසුකම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ රජය පිළිගත් අධ්‍යාපන ආයතනයකින් ලබා ගෙන තිබිය යුතුය.

5. අයදුම් කිරීමේ ක්‍රමය

පහත ආකෘතිය අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය ද සහිතව, ලියාපදිංචි තැපැලෙන් 2024...10.......මස.......03.. දිනට හෝ එදිනට පෙර ලැබෙන පරිදි " කොළඹ 07. ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය, ධර්මපාල මාවත, නො. 191, ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධන අංශය, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය, ලේකම්" වෙතට එවිය යුතුය. අයදුම් පත්‍රය බහා ඇති කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි " ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ කළමනාකරණ සහකාර අධි පන්තියේ සේවා ගණයේ සහකාර කථිකාචාර්ය තනතුරෙහි පුරප්පාඩු පිරවීම " යන වාක්‍ය පැහැදිලි ලෙස ලිවිය යුතුය. එදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාර නොගන්නා අතර අයදුම්පත අස්ථානගත වීම හෝ ප්‍රමාද වීම සම්බන්ධයෙන් පැමිණිලි ද භාරගනු නොලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය
දිනය : 2024...09....19...

ආදර්ශ අයදුම් පත්‍රය

**<u>ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ කළමනාකරණ සහකාර අධිපන්තිය සේවා ගණයේ සහකාර කථිකාචාර්ය තනතුර සඳහා වන සීමිත බඳවා ගැනීම.</u>**

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා [ ]

1. නම :

1.1 මුලකුරු අගට යොදා මුල මුලකුරු සමඟ නම :

.................................................................................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරින් , උදා SILVA A . B)

1.2 මුලකුරු වලින් හැඳින්වෙන නම් :

.................................................................................................................................

.................................................................................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරින් )

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්) :

.................................................................................................................................

.................................................................................................................................

2. 2.1 පෞද්ගලික ලිපිනය :

.................................................................................................................................

.................................................................................................................................

2.2 කාර්යාලයීය ලිපිනය :

.................................................................................................................................

.................................................................................................................................

2.3 ලිපි යොමු කළ යුතු ලිපිනය :

.................................................................................................................................

.................................................................................................................................

2.4 දුරකථන අංකය : .................................................................................................

3. 3.1 උපන් දිනය - [ | | | ] වර්ෂය [ | ] මාසය [ | ] දිනය

3.2 ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස - අවු :...... මාස :.......දින: ......

3.3 ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

4 4.1 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී [ ]
පුරුෂ [ ]

4.2 විවාහක /අවිවාහක/ වැන්දඹු ද යන වග :
[ ] විවාහක
[ ] අවිවාහක
[ ] වැන්දඹු

5. ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ ක්‍රීඩා උපදේශක තනතුරට පත් වූ දිනය :.................................

6. ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ ක්‍රීඩා උපදේශක තනතුරේ ස්ථිර කල දිනය :.................................

. . ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ ක්‍රීඩා උපදේශක තනතුරක වසර පහක (05) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන දිනය : ..............................................................................

8. iii වන පන්තියට නියමිත කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කළ දිනය : .........................................

9. 9.1 අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වාසන්න වසර 05 කාලය තුළ සියළු වැටුප් වර්ධක උපය ගෙන තිබේද? ඔව්/ නැත

9.2 එම කාලය තුළ අවවාදයකට නොඅඩු විනය දඬුවමකට ලක්ව තිබේද ? ඔව් / නැත

10. මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සඳහන් කරන ලද සියළු තොරතුරු සත්‍යවුත්, නිවැරදිවූත් ඒවා බව මෙයින් සහතික කරමි . මා මෙම තනතුරට තෝරා ගැනීමට ප්‍රථම මෙහි සඳහන් කිසියම් තොරතුරක් අසත්‍ය බව හෙළි වුවහොත් මා නුසුදුසු පවට පත්වන බවත් , තෝරා ගැනීමෙන් පසුව හෙළි වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

දිනය ......................................... ......................................................

ඉල්ලුම්කරුගේ අත්සන

---

**දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සම්පූර්ණ කල යුතුය.**

01. පූර්වාසන්න වසර 5 තුළ මෙම නිලධාරියාට එරෙහිව විනය කටයුතු කිසිවක් සිදු කර ඇති ද ? ඔව් / නැත

02. පිළිතුර "ඔව්" නම් ඒ පිළිබඳ විස්තර පහත සඳහන් කරන්න

..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

03. නිලධාරියාගේ සේවා කාලය තුළ වැටුප් රහිත නිවාඩු ලබා ගෙන තිබේද ? ඔව් / නැත

04. පිළිතුර "ඔව්" නම් ලබාගත් වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර පහත සඳහන් කරන්න.

| අ/අ | නිවාඩු අනුමැතිය සඳහා අදාළ කොන්දේසිය | කාල සීමාව | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| I | ආයතන සංග්‍රහයේ V:2:5:4 | | |
| II | ආයතන සංග්‍රහයේ XII:16 | | |
| III | කළමනාකාර සේවා චක්‍රලේඛ අංක 10 | | |
| IV | කළමනාකාර සේවා චක්‍රලේඛ අංක 30 | | |
| V | ආයතන සංග්‍රහයේ XII:36 | | |
| VI | වෙනත් වැටුප් රහිත නිවාඩු | | |

05. අදාළ නොවන කොටස කපා හරින්න

මෙම නිලධාරියා,

- ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ ක්‍රීඩා උපදේශක තනතුරක ස්ථිර කර ඇති /නැති බව
- ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ ක්‍රීඩා උපදේශක තනතුරේ වසර (05) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති/ නැති බවත්, නියමිත වැටුප් වර්ධක පහ (05) උපයාගෙන ඇති/ නැති බවත්
- III වන පන්තියට නියමිත කාර්යක්ෂමතා කඩඉම සමත්ව ඇති / නැති බවත්
- අයදුම්පත්‍ර කැඳවීමේ අවසන් දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ සියළු වැටුප් වර්ධක උපයා ගෙන ඇති / නැති බවත්
- උසස් කිරීම් සඳහා සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානන්ට අනුකූලව දඬුවමක් ලබා ඇත / නැත.

සහතික කරමි.

මෙම අමාත්‍යාංශයේ ........................................................................ තනතුර දරණ .............................................................................................. මහතා / මහත්මිය / මෙය ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනයේ කළමනාකරණ සහකාර අධිපන්තිය සේවා ගණයේ සහකාර කථිකාචාර්ය තනතුරට (MN - 07) අයදුම් කිරීම සඳහා සියළු සුදුසුකම් සපුරා ඇති/නැති බැවින් මෙම අයදුම්පත නිර්දේශ කරමි/නොකරමි.

..................................................

දිනය

..............................................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන

නිල මුද්‍රාව